# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව එහි 20 වන සංවත්සරය සනිටුහන් කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2021 මාර්තු 1 වන දින එහි 20 වන සංවත්සරය සනිටුහන් කරයි. 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව 2001 මාර්තු 01 දින ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ස්ථාපිත කොට ඇත.

රක්ෂණ කර්මාන්තයේ නියාමකයා ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පසුගිය වසර 20 පුරාවට රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් සුරැකීම අරමුණු කර ගනිමින් රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය හා සංවර්ධනයට පහසුකම් සැපයීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් සුරැකීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය ගෞරවාන්විතව යුතුව වෘත්තීමය හා විචක්ෂණ අයුරින් පවත්වාගෙන යන බවට වගබලා ගැනීමයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද 2001 වසරේ සිට රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නිරන්තර නියාමන ක්‍රියාමාර්ග ගෙන ඇත. පසුගිය වසර 20ක කාලය තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වැදගත් සන්ධිස්ථාන රැසක් පසුකර ඇත. ඒ අතරින් ප්‍රධාන අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ;

1. රක්ෂණ කර්මාන්තයේ අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය වන ඵලදායී නියාමනය සඳහා වන නීති, රෙගුලාසි හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
2. 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත 2007, 2011 හා 2017 යන වර්ෂවලදී සංශෝධනය කිරීම.
3. දකුණු ආසියානු රක්ෂණ නියාමකයන්ගේ සංසදය සඳහා මූලාරම්භය ගැනීම හා 2001 දෙසැම්බර් මස සමාරම්භක රැස්වීම සංවිධානය කිරීම.
4. ගෝලීය රක්ෂණ ප්‍රමිති නියම කිරීමේ ආයතනය වන රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයෙහි (IAIS) සාමාජිකත්වය ලබා ගැනීම.
5. රක්ෂණ ඔම්බුඩ්ස්මන් යෝජනාක්‍රමය ස්ථාපිත කිරීම සඳහා සහාය දැක්වීම.
6. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII) හරහා පවත්වන රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කරන පුද්ගලයන් සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය හඳුන්වා දීම.
7. 2015 වසරේ සිට නීති පාදක ප්‍රාග්ධන රාමුවක සිට අවදානම් පාදක ප්‍රාග්ධන රාමුවක් වෙත මාරු වීම.
8. අවදානම් පාදක අධීක්ෂණ රාමුව (RBC) සකස් කිරීම හා අදාළ කරගැනීම.
9. සංයුක්ත රක්ෂණ ක්‍රමය අහෝසි කර ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීමේ අවශ්‍යතාව ඇති කිරීම.
10. රක්ෂණ කර්මාන්තයෙහි ණය කාලසීමාව විධිමත් කිරීම සඳහා වාරික ගෙවීමේ වගකීම (PPW) පිළිබඳ නියමය හඳුන්වා දීම.
11. සියළු ම රක්ෂණ සමාගම් බලපත්‍රලාභී කොටස් වෙළඳපොළ සමාගම් ලෙස සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාව ඇති කිරීම.
12. අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විභාග සඳහා වාණිජ විෂය ධාරාවෙහි විෂයක් ලෙස රක්ෂණය හඳුන්වා දීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සමග එක්ව විෂය මාලාවක් සකස් කිරීම.

**13.** රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හා රක්ෂණ හිමිකම් ගෙවීම සඳහා පහසුකම් සැලසීමට පරිපූර්ණ විමර්ශන අංශයක් ස්ථාපිත කිරීම සහ 98 වගන්තිය යටතේ අවශ්‍ය පරිදි නියෝග නිකුත් කිරීම.

**14.** "රක්ෂණ නියාමනයේ ස්වභාවය වෙනස් කිරීම"යන තේමාව යටතේ 2015 ජූලි මස කොළඹ දී රක්ෂණ නියාමකයන්ගේ සමුළුවෙහි ආසියානු සංසදයේ (AFIR) 10වන වාර්ෂික රැස්වීම සංවිධානය කිරීම/ සත්කාරක සේවා සැපයීම.

**15.** නියාමකගේ නම වූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (IBSL) යන්න ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස වෙනස් කිරීම.

**16.** සැප්තැම්බර් 1 දින ජාතික රක්ෂණ දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා රජයේ අනුමැතිය ලබාගැනීම.

**17.** ජනතාව අතර රක්ෂණය පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීම සඳහා සමාජ වගකීම් වැඩසටහන් (CSR initiatives) ක්‍රියාත්මක කිරීම.

**18.** දිවයින පුරා රක්ෂණය පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ පැවැත්වීම.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව එහි 20 වන සංවත්සරය සනිටුහන් කිරීම මුලික කරගෙන වැඩසටහන් කිහිපයක් සංවිධානය කර ඇත. ඒ අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වඩාත් තොරතුරු අන්තර්ගතකර නැවත ඇරඹීම, රක්ෂණය පිළිබඳ පණිවිඩ ලබා දීම සඳහා YouTube නාළිකාව, Facebook හා LinkedIn පිටු ඇරඹීමද, කොමිෂන් සභාවෙහි දීර්ඝ කාලයක් පුරාවට සේවය කරන ලද සේවකයන් ඇගයීම සිදු කරනු ලබයි.